# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 2010 අංක 3 දරන හැම්ප්ටන් විලේජ් ශ්‍රී ලංකා භාරය (සංස්ථාගත කිරීමේ) පනත

---

**[සහතිකය සටහන් කළේ 2010 පෙබරවාරි මස 09 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2010 පෙබරවාරි මස 12 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක්
වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකි ය.

**මිළ :** රු. **6.00** යි. තැපැල් ගාස්තුව **:** රු. **5.00** යි.

## 2010 අංක 3 දරන හැම්ප්ටන් විලේජ් ශ්‍රී ලංකා භාරය (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 2010 පෙබරවාරි මස 09 වන දින]

එල්. ඩී.— ඕ. (අයි.එන්.සී.) 21/2007.

### හැම්ප්ටන් විලේජ් ශ්‍රී ලංකා භාරය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

**පූර්විකාව.**

වෙනත් කරුණු අතර ගාලු දිස්ත්‍රික්කයේ සුනාමි ව්‍යසනයට ගොදුරු වූවන් සඳහා හැම්ප්ටන් විලේජ් ශ්‍රී ලංකා යනුවෙන් නම් කරනු ලබන ආදර්ශ ගමක් ඉදි කිරීමේ කාර්ය සඳහා "සහන අරමුදල හැම්ප්ටන් ශ්‍රී ලංකා භාරය" යනුවෙන් සඳහන් කරනු ලබන සහ හඳුන්වනු ලබන භාරයක් එහි සාමාජිකයන් විසින් එකඟ වූ රීතිවලට අනුව පිහිටුවනු ලැබ ඇති හෙයින් ද :

එකී භාරයේ භාරකරුවන් විසින් එකී භාරය සංස්ථාගත කිරීම සඳහා ඉල්ලීමක් කර ඇති හෙයින් හා එකී ඉල්ලීමට ඉඩදීම පොදු යහපතට හේතුවන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

**ලුහුඬු නාමය.**

1. මේ පනත 2010 අංක 3 දරන හැම්ප්ටන් විලේජ් ශ්‍රී ලංකා භාරය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

**හැම්ප්ටන් විලේජ් ශ්‍රී ලංකා භාරය සංස්ථාගත කිරීම.**

2. මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භවන දිනයේ සිට සහ ඉන් පසුව (මෙහි මින් මතු "සහන අරමුදල, හැම්ප්ටන් ශ්‍රී ලංකා භාරය " යනුවෙන් සඳහන් කරනු ලබන) සහන අරමුදල, හැම්ප්ටන් විලේජ් ශ්‍රී ලංකා භාරයේ දැනට සාමාජිකයන්ව සිටිනතාක් තැනැත්තන් සහ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට මින්මතු සාමාජිකයන් වශයෙන් බඳවා ගනු ලබන තැනැත්තන් (මෙහි මින්මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) "හැම්ප්ටන් විලේජ් ශ්‍රී ලංකා භාරය "යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු අතර, ඒ නාමයෙන් සංස්ථාව විසින් ද ඊට විරුද්ධව ද, නඩු පැවරීමට හෝ පවරනු ලැබීමට ද පොදු මුද්‍රාවක් තබා ගැනීමට සහ එය පාවිච්චි කිරීමට ද තම අභිමතය පරිදි එය වෙනස් කිරීමටද පූර්ණ බලය හා අධිකාරය ඊට ඇත්තේ ය.

**සංස්ථාවේ පොදු පරමාර්ථ.**

3. සංස්ථාව පිහිටුවනු ලබන්නේ යම් පොදු පරමාර්ථ සඳහා ද එම පොදු පරමාර්ථ පහත සඳහන් පරිදි විය යුතු යැයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ:—

(අ) ක්‍රීඩා පිට්ටනියක්, වන්දනා කරන ස්ථානයක්, අත්‍යවශ්‍ය දේ සහ සිල්ලර බඩු විකිණීමේ පහසුකම් සහ ගමට අවශ්‍ය විය හැකි වෙනත් ගොඩනැගිලි සහ ව්‍යුහයන් ඇතුළත් වන ප්‍රජා මධ්‍යස්ථානයක් ද සහිත නිවාස පනහකින් සමන්විත හැම්ප්ටන් විලේජ් - ශ්‍රී ලංකා යනුවෙන් නම් කරනු ලබන ආදර්ශ ගමක් ඉදි කිරීම ;

(ආ) එකී ගමේ නඩත්තුව, වැඩිදියුණුව සහ කළමනාකරණය සඳහා අවශ්‍ය සියලු පියවර ගැනීම ;

(ඇ) ශ්‍රී ලංකා හැම්ප්ටන් විලේජ් පදිංචිකරුවන් සහ එංගලන්තයේ හැම්ප්ඩන් මිඩල් සෙක්ස් නගරයේ පදිංචිකරුවන් අතර සංස්කෘතික සම්බන්ධතාවය වැඩිදියුණු කිරීම ;

(ඈ) සිසුන් සහ තරුණ තැනැත්තන්ගේ විශේෂයෙන්ම ගමෙහි පදිංචි වී සිටින සිසුන් සහ තරුණ තැනැත්තන්ගේ අධ්‍යාපනය සහ පුහුණුව නගාසිටුවීම ; සහ

(ඉ) විශේෂයෙන් ම ගමෙහි පදිංචි වී සිටින තැනැත්තන්ගේ ආර්ථික සමාජයීය සහ සංස්කෘතික ප්‍රවර්ධනය නගාසිටුවීම ;

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

4. (1) 6 වන වගන්තිය යටතේ සාදන ලද සංස්ථාවේ රීතිවලට යටත්ව සංස්ථාවේ කටයුතු, සංස්ථාවේ රීතිවලට අනුව තෝරාගත් හෝ පත්කරන ලද සභාපති, උපසභාපති සහ වෙනත් නිලධාරි මඩුල්ලකින් සමන්විත (මෙහි මින්මතු "මණ්ඩලය" යනුවෙන් හඳුන්වනු ලබන) අධ්‍යක්ෂ මණ්ඩලයක් විසින් පරිපාලනය කරනු ලැබිය යුතු ය.

(2) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වූ දිනයට පෙරාතුවම වූ දිනයේ දී සහන අරමුදල හැම්ප්ටන් විලේජ් ශ්‍රී ලංකා භාරයේ භාරකාර මණ්ඩලයේ සාමාජිකයන්ගෙන් පළමු මණ්ඩලය සමන්විත විය යුතු ය.

(3) මණ්ඩලයේ සාමාජිකයන් සැබෑ ලෙසම ගරු කටයුතු තත්ත්වයෙන් කටයුතු කළ යුතු අතර, වැටුප්, දීමනා හෝ ප්‍රසාද මුදල් ආකාරයේ කිසිම පාරිශ්‍රමිකයක් ලැබීමට ඔවුන්ට හිමිකම්

නොතිබිය යුතු නමුත් තම කර්තව්‍ය ඉටු කිරීමේ දී ඔවුන් විසින් ඇත්තවශයෙන් ම දරන ලද යම් වියදම් ඔවුන් විසින් ප්‍රතිපූරණය කරගනු ලැබීමට හිමිකමක් තිබිය යුතු ය.

(4) යම් තැනැත්තකු මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් පත් කර ගැනීම හෝ සාමාජිකත්වය දිගටම දැරීම සඳහා පහත හේතූන් මත නුසුදුසු විය යුතු ය:—

(අ) ඔහු ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක යම් නීතියක් යටතේ බුන්වත් හෝ බංකොලොත් තැනැත්තකු ලෙස ප්‍රකාශයට පත් කර ඇත්නම් හෝ මුදා නොහරින ලද බුන්වත් හෝ බංකොළොත් තැනැත්තකු වන්නේ නම් ;

(ආ) චරිතමය විෂමාචාරයක් සම්බන්ධ වරදකට වරදකරු වී සිටී නම් ;

(ඇ) ශ්‍රී ලංකාවේ බලාත්මකව පවත්නා යම් නීතියක් යටතේ මන්ද බුද්ධික හෝ මානසික අශක්නුතාවක් ඇති තැනැත්තකු බවට අනාවරණය වී හෝ ප්‍රකාශයට පත් වී ඇත්නම් ;

(ඈ) මණ්ඩලයේ පූර්ව කැමැත්ත නොලබා එක් අවුරුද්දක් ඉක්මවන අඛණ්ඩ කාලයක් සඳහා ශ්‍රී ලංකාවෙන් බැහැරව ඇත්නම් ; හෝ

(ඉ) අධ්‍යක්ෂ ලෙස කටයුතු කිරීම අතපසු කොට හෝ පැහැර හැර ඇත්නම්.

**5.** මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව, පහත සඳහන් බලතල ද ඇතුළුව, සංස්ථාවේ පරමාර්ථ හෝ ඒ පරමාර්ථ අතරින් කිසිවක් කිරීම, ඉටු කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය හෝ හිතකර ක්‍රියා, කාරණා හෝ දේ කිරීමට සංස්ථාවට බලය ඇත්තේ ය:— සංස්ථාවේ සාමාන්‍ය බලතල.

(අ) සංස්ථාවේ කාර්ය සඳහා යම් නිශ්චල දේපළක් අත් කර ගැනීම, දැරීම, බද්දට හෝ කුලියට ගැනීම හෝ දීම, උකස් කිරීම, ඔඩපනය කිරීම, විකිණීම හෝ අන්‍යාකාරයකින් අන්සතු කිරීම හෝ බැහැර කිරීම ;

(ආ) සංස්ථාවේ අරමුණු ඉටු කර ගැනීම සඳහා හෝ සංස්ථාවේ බලතල ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය විය හැකි සියලු කොන්ත්‍රාත් හෝ ගිවිසුම්වලට සංස්ථාව විසින් කෙලින්ම

හෝ තත්කාර්ය සඳහා සංස්ථාව විසින් බලය දෙන ලද යම් නිලධරයකු හෝ අනුයෝජිතයකු මගින් හෝ ඇතුළත් වීම සහ ඉටු කිරීම හෝ පවත්වාගෙන යෑම ;

(ඇ) මුදලින් හෝ අන්‍යාකාරයකින් ත්‍යාග, පරිත්‍යාග සහ රික්තවරණ භාර ගැනීම ;

(ඈ) එහි අරමුදල් ආයෝජනය කිරීම සඳහා ඕනෑම බැංකුවක ජංගම, තැන්පතු සහ ඉතිරි කිරීමේ ගිණුම් පවත්වාගෙන යාම ;

(ඉ) සංස්ථාව විසින් සුදුසු යැයි තීරණය කරනු ලබන ආකාරයට සහ ඇප මත සංස්ථාවේ කාර්ය සඳහා මුදල් ණයට ගැනීම හෝ ආයෝජනය කිරීම ; සහ

(ඊ) සංස්ථාවේ අරමුණු ඉටු කිරීම සඳහා අවශ්‍ය වන නිලධරයන් සහ සේවකයන් පත් කිරීම, සේවයෙහි නියුක්ත කිරීම, මාරු කිරීම, ඔවුන් විෂයෙහි විනය පාලනය කිරීම සහ සේවයෙන් අස් කිරීම.

සංස්ථාවේ රීති.

6. (1) පහත දැක්වෙන සියලුම කාරණා හෝ ඉන් කිසිවක් සඳහා මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති, සංස්ථාවේ යම් මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන් තුනෙන් දෙකකට අඩු නොවන බහුතර ඡන්දයෙන් කලින් කල සංස්ථාව විසින් සෑදීම නීත්‍යානුකූල වන්නේ ය :—

(අ) සාමාජිකත්වය වර්ග කිරීම හා සාමාජිකයන් ඇතුළත් කර ගැනීම, ඉවත් කිරීම හෝ නෙරපීම;

(ආ) නිලධාරී මඩුල්ල තෝරා පත් කර ගැනීම, නිලධාරී මඩුල්ල ඉල්ලා අස්වීම හෝ ධුරය හිස් කිරීම නැතිනම් ධුරයෙන් ඉවත් කිරීම සහ ඔවුන්ගේ බලතල, සහ කාර්ය ;

(ඇ) මණ්ඩලයේ සාමාජිකයන් තෝරා ගැනීම සහ ඔවුන්ගේ බලතල, විනය හා කර්තව්‍ය ;

(ඈ) සංස්ථාවේ විවිධ නිලධරයන්, අනුයෝජිතයන් සහ සේවකයන්ගේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ;

(ඉ) මණ්ඩලයේ රැස්වීම්වල දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය, හෝ මණ්ඩලයේ රැස්වීම් කැඳවීම සහ පැවැත්වීම, එවැනි රැස්වීම්වල වේලාවන්, ස්ථාන, නිවේදන සහ න්‍යායපත්‍ර සහ එහි ගණපූරණය සහ එම රැස්වීම්වල ක්‍රියාකාරකම් ; සහ

(ඊ) සංස්ථාවේ දේපළ පරිපාලනය කිරීම සහ කළමනාකරණය කිරීම සහ එහි අරමුදල් දැරීම.

(2) සංස්ථාව විසින් සාදන රීති, (1) වන උපවගන්තිය යටතේ සාදන ලද රීතියක් ආකාරයෙන් එවැනිම රැස්වීමක දී සංශෝධනය කිරීම, වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම හෝ පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(3) සංස්ථාවේ සාමාජිකයන් සෑම අවස්ථාවක දී ම සංස්ථාවේ රීති වලට යටත් විය යුතු ය.

සංස්ථාවේ අරමුදල.

**7.** (1) සංස්ථාවට එහිම අරමුදලක් තිබිය යුතු අතර, සංස්ථාව සඳහා සහ එය වෙනුවෙන් මීට පෙර භාරගත් සහ මින්මතු භාරගනු ලබන ත්‍යාග, තෙස්තමේන්තු නීයාදන, පැවරුම්, පරිත්‍යාග, සම්මාදම් මුදල්, දායක මුදල්, ගාස්තු හෝ ප්‍රදාන හෝ වෙනත් යම් මූල්‍ය ආයෝජන වශයෙන් ලැබෙන සියලු මුදල් මණ්ඩලය විසින් තීරණය කරනු ලබන පරිදි එක් බැංකුවක හෝ බැංකු වැඩි ගණනක, සංස්ථාවේ බැරට තැන්පත් කරනු ලැබිය යුතු ය.

(2) සංස්ථාව විසින් එහි බලතල සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී සහ ඉටු කිරීමේ දී දරන ලද සියලු වියදම් සිය අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

ගිණුම් සහ විගණනය

8. (1) සංස්ථාවේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

(2) සංස්ථාව විසින් එහි ආදායම හා වියදම, වත්කම් සහ බැරකම් සහ සංස්ථාවේ වෙනත් සියලු ගනුදෙනු පිළිබඳව නිසි ගිණුම් තබා ගැනීමට කටයුතු සලස්වනු ලැබිය යුතු ය.

(3) සංස්ථාවේ ගිණුම් මණ්ඩලය විසින් පත් කරනු ලබන සුදුසුකම්ලත් විගණකවරයකු විසින් විගණනය කරනු ලැබිය යුතු ය.

(4) මේ වගන්තියේ 'සුදුසුකම්ලත් විගණක' යන්නෙන් :—

(අ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වූ ද, ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීමට ඒ ආයතනය විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද තැනැත්තෙක් ; හෝ

(ආ) යම් ගණකාධිකාරී සමාගමක එක් එක් නේවාසික හවුල්කරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු ව සිටින්නේ ද, එමෙන් ම ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියේ යෙදීම සඳහා එකී ආයතනය විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නේ ද, එවැනි වරලත් ගණකාධිකාරී හවුල් සමාගමක්,

අදහස් වේ.

සංස්ථාවේ මුද්‍රාව.

**9.** සංස්ථාවේ මුද්‍රාව ලේකම්වරයාගේ භාරයේ තිබිය යුතු අතර, සභාපති සහ ලේකම්වරයා හෝ මණ්ඩලය විසින් නිසි ලෙස බලය දෙන ලද වෙනත් යම් තැනැත්තකු ඉදිරිපිට දී හැර සංස්ථාවේ මුද්‍රාව කිසිම සාධන පත්‍රයකට නොතැබිය යුතු අතර තමන් පැමිණ සිටි බවට ලකුණක් වශයෙන් ඔවුන් විසින් ඒ සාධණ පත්‍රයේ තම නම අත්සන් කළ යුතු අතර එසේ කරනු ලබන අත්සන් කිරීමක් සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකු විසින් තබන ලද අත්සනට පරිබාහිරව විය යුතු ය.

භාරයට අයවිය යුතු සහ භාරය විසින් ගෙවිය යුතු ණය.

**10.** මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී සහන අරමුදල හැම්ප්ටන් ශ්‍රී ලංකා භාරයේ පැවැති සියලු ණය සහ බැරකම් මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාව විසින් ගෙවනු ලැබිය යුතු අතර, එම දිනයේ දී සහන අරමුදල හැම්ප්ටන් ශ්‍රී ලංකා භාරයට අයවිය යුතු සියලු ණය, එයට ගෙවිය යුතු සම්මාදම් මුදල් සහ දායක මුදල් මේ පනතේ කාර්ය සඳහා සංස්ථාව වෙත ගෙවනු ලැබිය යුතු ය.

සාමාජිකයන්ගේ වගකීම් සීමා කිරීම.

**11.** සංස්ථාවේ කිසිම සාමාජිකයකු සංස්ථාවේ ණය සහ බැරකම් නිදහස් කිරීමේ කාර්යය සඳහා හෝ වෙනත් යම් කාර්යක් සඳහා හෝ ඔහුගෙන් සංස්ථාවට අයවිය යුතු සාමාජික ගාස්තුවල ප්‍රමාණය ඉක්මවන දායක මුදලක් ගෙවීමට යටත් නොවිය යුතු ය.

12. ඕනෑම ආකාරයකින් උපචිත වූ සංස්ථාවේ යම් මුදල් හෝ දේපළ මෙහි නිශ්චිතව දක්වා ඇති සංස්ථාවේ අරමුණු නගාසිටුවීම සඳහාම පමණක් යොදා ගත යුතු අතර එහි කිසිම කොටසක් සෘජුවම හෝ වක්‍රාකාරයෙන් කොටස්, බෝනස් ලාභ හෝ වෙනත් ආකාරයකින් සංස්ථාවේ සාමාජිකයන් වෙත ගෙවීම හෝ පැවරීම නොකළ යුතු ය. මුදල් සහ දේපළ යොදා ගැනීම.

13. මේ පනතේ විධිවිධානවලට යටත්ව, යම් මිලට ගැනීමක් ප්‍රදානයක්, ත්‍යාගයක්, තෙස්තමේන්තු නීයාදනයක් හෝ වෙනත් ආකාරයකින් චංචල හෝ නිශ්චල යම් දේපළක් අත් කර ගැනීමට හෝ දැරීමට සංස්ථාවට නීතියෙන් බලය හා හැකියාව ඇති අතර, ඒ දේපළ 6 වන වගන්තිය යටතේ සාදන ලද සංස්ථාවේ රීතිවලට යටත්ව විකිණීමට, උකස් කිරීමට, බදු දීමට, හුවමාරු කිරීමට හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීමට පූර්ණ බලය ඇතිව සංස්ථාවේ කාර්ය සඳහා සංස්ථාව විසින් එම සියලු දේපළ දැරිය යුතු ය. සංස්ථාවට චංචල හා නිශ්චල දේපළ දැරිය හැකි බව.

14. සංස්ථාව විසුරුවා හරිනු ලැබූවිට එහි සියලුම ණය සහ බැරකම් ගෙවා සමථයකට පත් කරනු ලැබීමෙන් පසු කවර හෝ යම් දේපළක් ඉතිරි වේ නම්, ඒ දේපළ සංස්ථාවේ සාමාජිකයන් අතර බෙදා දෙනු නොලැබිය යුතු අතර, සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූ ද යම් ආදායමක් හෝ ලාභ කිසිවක් තම සාමාජිකයන් අතර බෙදා දීම රීති මගින් තහනම් කරනු ලැබ ඇත්තා වූ ද වෙනත් ආයතනයකට හෝ ආයතනවලට එම දේපළ දීම හෝ පැවරීම කරනු ලැබිය යුතු ය. එකී ආයතනය හෝ ආයතන සංස්ථාව විසුරුවා හරිනු ලබන අවස්ථාවේ දී හෝ ඊට පෙරාතුව සංස්ථාවේ සාමාජිකයන් විසින් තීරණය කරනු ලැබිය යුතු ය. විසුරුවා හැරීමෙන් පසු ඉතිරිවන දේපළ.

15. ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක අයිතිවාසිකම්වලට මේ පනතේ ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය. ජනරජයේ සහ අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

16. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය. අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.